# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1718/3 - 2011 අගෝස්තු 08 වැනි සඳුදා - 2011.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/13/09/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.02.18 දිනැති හා අංක 1693/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.02.10 වැනි දින දරන නියෝගයෙන් එක් පාර්ශවයක් වශයෙන් අළුබෝමුල්ල, මහබෙල්ලන, අංක 157 ඒ හි ඩී. කොල්වින් පීරිස් මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2011.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 ජූලි මස 18 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

එක් පාර්ශවයක් වෙනුවෙන්,

ඉල්ලුම්කරු

කොල්වින් පීරිස් මහතා,
අංක 157 A, මහබෙල්ලන,
අළුබෝමුල්ල

එදිරිව

නඩු අංකය : ඒ 3375

සහ

අනෙක් පාර්ශවය වෙනුවෙන්
වගඋත්තරකරු

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳවයි

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වැනි පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව උක්ත ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් 2011.02.10 වැනි දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

මා වෙත බේරුම්කිරීම සඳහා පැවරුණු කාරණය මෙසේය.

"ශ්‍රී ලංකා ලංකා ගමනා ගමන මණ්ඩලයේ පානදුර ඩිපෝවේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරේ සේවය කර 2008.07.19 දින සේවයෙන් විශ්‍රාම ලැබූ ඩී. කොල්වින් පීරිස් මහතාට 2006.07.01 දින සිට 2008.06.30 දින දක්වා වූ කාලසීමාව සඳහා.

01. හිඟ වැටුප් ජීවන වියදම් දීමනාව ලැබීම සඳහා හිමිකම් තිබේද

02. හිමිකම් ඇත්නම්, එය කුමන ප්‍රමාණයක මුදලක් විය යුතු ද යන්න පිළිබඳව වේ."

**පැමිණිලිකරුගේ ස්ථාවරය සහ ඔහු ඉල්ලා සිටින බේරුම්කරණය**

පැමිණිලිකරු අවු. 37 කට අධික කාලයක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කර 2008.07.19 දින විශ්‍රාම ගිය සේවකයෙකි. පැමිණිලිකරුට හිමිවිය යුතු ජීවන අංක දීමනාව සහ පාරිතෝෂික මුදල් විශ්‍රාම යෑමෙන් පසුව වුවද තමන්ට නොලැබීම ගැන ඔහු කම්කරු ඇමතිතුමාට පැමිණිල්ලක් මගින් කරුණු ඉදිරිපත් කර ඇත.

මේ පිළිබඳ පානදුර කම්කරු කාර්යාලයේදී විභාග කරන ලදුව හිඟ ජීවන අංක දීමනාව ගෙවිය යුතු බවත් එය පාරිතෝෂික මුදලට එකතුවිය යුතු බවත් පිළිගන්නා ලද අතර එම මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඒ වන විටත් ප්‍රධාන කාර්යාලයෙන් නොලැබුණු බව පානදුර ඩිපෝ කළමණාකරු (මුදල්) තමන්ට දන්වා සිටි බවත් පැමිණිලිකරු කියා සිටී. ඒ අනුව තමන්ට ලැබිය යුතු මුළු ජීවන අංක මුදල හා හිඟ ජීවන අංක මුදල රු.38,250/- ක් පමණ වන බව ඉල්ලුම්කරු කියා සිටී.

**මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය**

තමන් විසින් දැනට පැමිණිලිකරුට ගෙවිය යුතුව ඇත්තේ ජීවන වියදම් දීමනාව පමණි. ඔහුට ගෙවිය යුතුව තිබුණු මුළු හිඟ වැටුප් මුදල රු.27,226.75ක් විය. ඒ අනුව අවස්ථා 4 කදී ඉන් රු.23,316.75ක් ගෙවා ඇත. ගෙවිය යුතුව ඉතිරිව ඇති හිඟ මුදල රු.3,910/- ක් වන අතර එම හිඟ මුදල ගෙවීමට වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිට නීතිඥ ශලිනි පතිනාදන් මහත්මිය කැමැත්ත ප්‍රකාශ කර සිටියාය.

**පෙනී සිටීම**

පැමිණිලිකරු වන බී. කොල්වින් පීරිස් මහතා තමා වෙනුවෙන් පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ ශලිනි පතිනාදන් මහත්මිය පෙනී සිටියාය. ආයතනය වෙනුවෙන් කළමණාකාර (මුදල්) වයි. ඩබ්. සමන් කුමාර මහතා පෙනී සිටියේය.

**පැමිණිලිකරුගේ පිළිතුරු ප්‍රකාශය**

වගඋත්තරකරු විසින් ප්‍රකාශිත පරිදි තමන්ට අයවිය යුතු මුදල රු.3910/- ක් නොව එය රු.37,000/-ක් පමණ වූ මුදලක් බව පැමිණිලිකරු යළිත් වරක් ප්‍රකාශ කර සිටියේය. එහෙයින් වගඋත්තරකරු විසින් දැනට තමාට ගෙවීමට එකඟ වී ඇති මුදල වන රු.3910/- තමන් භාරගන්නා අතර ඉතිරි මුදල් අය කර ගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීමේ අයිතිය තමන් වෙත රඳවා ගනිමින් බේරුම්කරු අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීම මෙයින් නිම කරන බව දන්වා සිටියේය.

**නිගමනයන්**

පැමිණිලිකරු වගඋත්තරකරු විසින් ගෙවීමට පොරොන්දු වූ මුදල වන රු.3910/- භාර ගැනීම මගින් බේරුම්කරණයේ කටයුතු නිමාවට පත් කිරීමට දෙපාර්ශවයම එකඟ වීම හේතුවෙන් බේරුම්කරණයට පැවරනු කාර්යය එතෙකින් නිම කිරීමට තීරණය කළෙමි. මුළු හිඟ වැටුප් වශයෙන් පැමිණිලිකරුට රු.27,266.75ක් පමණක් ගෙවිය යුතු බවට වගඋත්තරකරු විසින් කරන ප්‍රකාශය පිළිබඳ කිසිවක් ප්‍රකාශ නොකළේය. එසේම වගඋත්තරකරුගේ ප්‍රකාශයෙන් කියවෙන්නේ ඒ මුදල පැමිණිලිකරුට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ වැටුප් මුදල බවය. එහෙයින් වගඋත්තරකරුගේ ප්‍රකාශය සමග මම එකඟ වෙමි.

**ප්‍රදානය**

මේ අනුව ඉල්ලුම්කරුට හිඟ වැටුප්, ජීවන වියදම් දීමනාව ලැබීමට හිමිකම් ඇති බව බේරුම්කරණය පිළිගනී. එසේම ඉල්ලුම්කරුට එසේ ලැබිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු.3910/- ක් වශයෙන් වගඋත්තරකරු විසින් පිළිගෙන ඊට අදාළ මුදල චෙක්පතක් මගින් ගෙවන ලදුව එය ඉල්ලුම්කරු විසින් අත්සන් කර භාරගන්නා ලදී. ඒ අනුව මෙම නඩුව සමථයකට පත් කරන ලදී.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව මාගේ නිගමනය වේ.

ඊ. එම්. ජී. එදිරිසිංහ,
බේරුම්කරු.

2011 ජූනි මස 27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

08 - 581

---

මගේ අංකය : IR/22/32/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.02.15 දිනැති හා අංක 1693/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.02.01 වැනි දින දරන නියෝගයෙන් එක් පාර්ශවයක් වශයෙන් ගල්ගමුව, සියඹලාන්ගමුව, උස්ගල, අංක 318/3 හි ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 09, බේස්ලයින් පාර, නො. 260/20 හි පිහිටි මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2011.06.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 ජූලි මස 05 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

එක් පාර්ශවයක් වශයෙන්,

ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක මහතා,
අංක 118/3, උස්ගල,
සියඹලාන්ගමුව,
ගල්ගමුව.

එදිරිව

නඩු අංකය ඒ 3373

හා

අනෙක් පාර්ශවය වශයෙන්,

මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම,
නො.260/20, බේස්ලයින් පාර,
කොළඹ 09.

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳවයි

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව උක්ත ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් 2011.02.01 වැනි දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශවය අතර පැවති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ.

මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම යටතේ පාලනය වූ නිරාවිය ගොවිපොළට අනුයුක්තව අනියම් රියදුරෙක් වශයෙන් සේවය කරමින් සිටියදී 2005.10.03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කරනු ලැබූ ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක මහතාට නැවත රැකියාව ලබා නොදීම යුක්තිසහගත ද යන්න හා යුක්තිසහගත නොවේ නම්, ඔහුට කුමන සහනයක් ලැබිය යුතු ද යන්න පිළිබඳව වේ.

**පෙනී සිටීම**

පළමු පාර්ශවය වන ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක තමා වෙනුවෙන් පෙනී සිටි අතර දෙවන පාර්ශවය වන මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම වෙනුවෙන් නීති නිලධාරිණී ආශා හෙට්ටිආරච්චි මහත්මිය පෙනී සිටින ලදී.

මෙම නඩුව 2011.03.31 වැනි දින කැඳවූ අවස්ථාවේදී දෙපාර්ශවය විසින්ම ඔවුන්ගේ පළමු ප්‍රකාශ විධිමත්ව ගොනු කර තිබුණි. 2011.04.18 දින දෙපාර්ශවයම විසින් ඔවුන්ගේ දෙවන ප්‍රකාශ විධිමත්ව ගොනු කරන ලදී.

ඉන් අනතුරුව 2011.04.27 වැනි දින දෙපාර්ශවයම දීර්ඝ සාකච්ඡාවකින් පසුව අධිකරණයේ යෝජනාවක් පරිදි මෙම ආරවුල සම්ථයකට පත් කරගන්නා බව ප්‍රකාශ කළ අතර සමථය සලකා බැලීම සඳහා කල් ලබා දෙන ලදී.

ඒ අනුව 2011.06.13 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී දෙපාර්ශවයම අධිකරණයේ යෝජනාව පරිදි මෙම නඩුව සමථයට පත් කර ගැනීමට එකඟ බව ප්‍රකාශ කළ අතර පහත සඳහන් සමථ කොන්දේසි වලට යටත්ව දෙපාර්ශවයම සමථයකට එළඹෙන ලදී.

**එම සමථ කොන්දේසි මෙසේය**

01. දෙවන පාර්ශවකරු පළමු පාර්ශවකරුට පසු වේතනයකින් තොරව සේවය කඩ කිරීම් සහිතව 2011.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අනියම් පදනම මත සීමාසහිත මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම යටතේ නිරාවිය සත්ව ගොවිපළෙහි රියදුරු වශයෙන් වැඩ ප්‍රදානය කිරීමට එකඟ වේ.

02. දෙවන පාර්ශවකරු 2011 ජූනි 24 වැනි දින හෝ ඊට පෙර පළමු පාර්ශවයට විධිමත් පත්වීම් ලිපිය ලි.ප.තැ. යැවීමට එකඟ විය.

03. පළමු පාර්ශවකරුට අනියම් පදනම මත සේවය ප්‍රදානය කර ඇති බැවින් මාස 06ක පරිවාස කාලය තුළ අවධානයෙන්, කාර්යක්ෂමව සතුටුදායකව තම සේවය ඉටු කිරීමට එකඟ විය.

04. පළමු පාර්ශවකරුට 2011 ජූලි 01 වැනි දින සිට සියලුම නීතිමය වැටුප් හා දීමනා වලට හිමිකම් ඇත.

05. මේ කොන්දේසි වලට යටත්ව පළමු පාර්ශවකරු වන ආර්. එම්. නිමල් ආරියවංශ රත්නායක සහ දෙවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින නීති නිලධාරිණී ආශා හෙට්ටිආරච්චි මහත්මිය සමථ කොන්දේසි කියවා තේරුම් ගෙන නඩු වාර්තාවේ අත්සන් තබන ලදී.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව මාගේ නිගමනය වේ.

ටී. එඩ්මන්ඩ් සාන්තරාජන්,
බේරුම්කරු.

2011 ජූනි මස 16 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

08 - 582

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.